





## ඉල්ලීම් ලැබෙනතුරු සෞඛ්‍ය සේවකයෝ
# රටපුරා රෝහල් 50 ක විරෝධතා

ආදේශක සේවකයින් වහාම ස්ථිර කිරීම, පුහුණුව නිමකළ උපස්ථායක පත්වීම් ලබාදීම, කොවිඩ් විශේෂ දීමනාව වහා ලබාදීම, දින පහේ සතිය ක්‍රියාත්මක කිරීම, එකඟ වූ රු. 12,000/- නිල ඇඳුම් දීමනාව වහා ලබාදීම, සෞඛ්‍ය සේවාවේ පුරප්පාඩු විධිමත් ක්‍රමයකට පිරවීම, විධිමත් මාරු මණ්ඩල ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ඇතුළු සෞඛ්‍ය සේවක ඉල්ලීම් දිනාගැනීමත්, එකඟ වූ ඉල්ලීම් තහවුරු කරගැනීමත් අරමුණින් මාර්තු 31 දින රටපුරා රෝහල් 50 ක් ඉදිරිපිට විරෝධතා ක්‍රියාමාර්ග ආරම්භ කෙරුණි.

සමස්ත ලංකා සුවසේවා සංගමය සංවිධායකත්වයෙන් දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පිරිදි මෙම උද්ඝෝෂණ පැවැත්වූ අතර එම සංගමයේ ලේකම් මහින්ද ගුරුගේ සහෝදරයා පැවසුවේ මාර්තු 31 දින සිට ඉල්ලීම් ලැබෙන තෙක් අඛණ්ඩ ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බවත් ඒ අනුව අප්‍රේල් 6 දින සංකේත වැඩවර්ජනයක් ක්‍රියාත්මක කිරීමටත් අප්‍රේල් 7 සෞඛ්‍ය සේවකයින්ගේ සහභාගීත්වයෙන් කොළඹට පැමිණ ජාතික රෝහලේ සිට සෞඛ්‍ය අමාත්‍යාංශය දක්වා පා ගමනක් පැවැත්වීමටත් තීරණය කොට ඇති බවයි.

## වැටුප් වැඩිවීම ඇතුළු ඉල්ලීම් රැසක් දිනාගැනීමට
# විදුලි සේවකයෝ උද්ඝෝෂණයේ

වසර 3 කට වරක් සිදුවිය යුතු වැටුප් වැඩිවීම විදුලිබල සේවකයින්ට 2021 ජනවාරි සිට හිමිවිය යුතු වුවත් මේ දක්වා එම වැඩිවීම ලබා දී නොමැති අතර මෙයට අදාලව විදුලිබල ඇමතිවරයා ඇතුලු පාලනාධිකාරිය නිහඬ පිලිවෙතක් අනුගමනය කර කල් මරමින් සිටීමට විරෝධය දක්වමින් සහ තවත් ඉල්ලීම් රැසක් මුල්කර ගනිමින් රටපුරා සිටින ලංවිම සේවකයෝ මාර්තු 24 විදුලිබල මණ්ඩල මුලස්ථානය ඉදිරිපිට දැවැන්ත උද්ඝෝෂණයක නිරත විය. ලංවිම ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානයේ සම කැඳවුම්කරු රංජන් ජයලාල් සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නායකයින් සහ රටපුරා සිටින විදුලි සේවකයින් එයට සහභාගී විය.

# ආයුර්වේද වෛද්‍යවරු උද්ඝෝෂණයක

විධිමත් ස්ථාන මාරු පටිපාටිය නොසලකිමින් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ තීන්දු අත්හිටුවමින් දේශපාලන බලහත්කාරය යොදවා කිසිඳු සාධාරණ හේතුවකින් තොරව අත්තනෝමතිකව ස්ථාන මාරු අවලංගු කිරීමට එරෙහිව සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය නිලධාරී සංගමය මගින් අද (03) මරදාන දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඉදිරිපිටදී විරෝධතාවයක නියැලිනි. එම විරෝධයෙන් පසු මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට අමාත්‍යවරයා සමග සාකච්ඡාවක් මාර්තු 10 දින ට ලබාදුන් බව එම සංගමයේ ලේකම් කේ.පී.ආර්.එස්. ගුණරත්න පැවසීය.




## ඉන්දීය ගොවිජන අරගලයට
# වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සහාය

ඉන්දීය ගොවි ජනතාව අපහසුතාවයට සහ අගාධයට ඇද දමමින් ඉන්දියානු මෝදි අගමැතිගේ නීති පැනවීමත්, ගජමිතුරු අදානි වැනි ව්‍යාපාරිකයන්ට ගොවි ජනතාව කොල්ලකෑම සඳහා ඉඩ සැලසීමත් හේතුවෙන් ඉන්දියාව පුරා පැන නැගී ඇති ගොවි ජනතාවගේ සටනට සහයෝගය පලකරමින් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය විසින් මාර්තු 18 දින දෙහිවල, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථාන රැස්වීම් ශාලාවේදී සම්මන්ත්‍රණයක් පැවැත්විය.

මෙම සම්මන්ත්‍රණය සඳහා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක, සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ කැඳවුම්කරු නාමල් කරුණාරත්න, අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරි යන සහෝදරවරුන් සහභාගි විය.



## ජනවාරි වැඩිවිය යුතු වැටුප වැඩි නොවීමට එරෙහිව ජල සම්පාදන සේවකයෝ විරෝධතාවයේ..

ජල සම්පාදන සේවකයින් සඳහා වසර තුනෙන් තුනට වැඩිවන නව වැටුප් වැඩිවීම 2021 ජනවාරි මස සිට ලැබිය යුතු වූවද මෙතෙක් නොලැබීමට එරෙහිව සහ තවත් ඉල්ලීම් රැසක් මුල්කර පසුගිය මාර්තු 23 ගොළුමඩම ජල සම්පාදන මුලස්ථාන කාර්යාලය ඉදිරිපිට විරෝධතාවයක් පැවැත්විය.

මෙම ඉල්ලීම් මුල්කරගෙන ආරම්භ කරන විරෝධතාවයන්ට නිසි සවන්දීමක් සිදු නොවන්නේ නම් ඉදිරියේදී වැඩවර්ජන ක්‍රියාමාර්ග වලට එලැඹීමට ද සූදානමින් සිටින බව ජල සම්පාදන වෘත්තීය සමිති ඒකාබද්ධ සන්ධානයේ සම කැඳවුම්කරු උපාලි රත්නායක සහෝදරයා පැවසීය.



## විශ්‍රාම වැටුප් කප්පාදුවට එරෙහි නඩුව අභියාචනාධිකරණයේදී කැඳවේ

විශ්‍රාම ගිය 120,000 කට අධික විශ්‍රාමිකයින්ට 2020. 01. 01 සිට ගෙවිය යුතු විශ්‍රාම වැටුප වර්තමාන ආණ්ඩුව විසින් අත්හිටුවීම නිසා විශ්‍රාමිකයින්ගේ හිමිකම් සුරැකීමේ ජාතික සංවිධානය මගින් ගොනු කරන ලද අභියාචනාධිකරණයේ නඩුව පසුගිය මාර්තු 17 දින නැවත කැඳවන ලදී. එම නඩුව නැවත 2021. 05. 17 දිනට කල් තබන ලද අතර මෙම අවස්ථාව සඳහා එම සංවිධානයේ ජාතික සංවිධායක මහින්ද ජයසිංහ, නීතිඥ සුනිල් වටගල, එම සංවිධානයේ ලේකම් කේ. සරත්ලාල් පෙරේරා, සභාපති යූ. පලිහවඩන ඇතුලු විශ්‍රාමිකයින් සහභාගී විය.



## ගැටළුවලට විසඳුමක් නැත්නම්
# උපාධිධාරීන් වැඩවර්ජනයක් අභියස

1999 - 2021 MN 4 ආශ්‍රිත රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා උපාධිධාරීන්ගේ වෘත්තීය ඉල්ලීම් ලබාදෙන ලෙස බලකරමින් අද දින (04) ජාතික විරෝධතාවක් ප්‍රකාශයට පත්කර තිබූ අතර එහිදී රටපුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඉදිරිපිට විරෝධතා උද්ඝෝෂණ පවත්වමින් පෙත්සමක් භාරදීමට කටයුතු කළහ. සංවර්ධන නිලධාරී සේවා සංගමය හා රැකියාලාභී උපාධිධාරී සංගමය එක්ව පැවැත්වූ මෙම විරෝධතාවයේ කොළඹ දිස්ත්‍රික් උද්ඝෝෂණය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ඉදිරිපිට පැවැත්වුණි. මෙම ගැටළුවලට දින 14 ක් තුල පෙර විසඳුමක් ලබාදීමට ආණ්ඩුව කටයුතු නොකරන්නේ නම් දීපව්‍යාප්ත වැඩවර්ජනයකට යාමට කටයුතු කරන බව සංවර්ධන නිලධාරී සේවා සංගමයේ ප්‍රධාන ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයා කොළඹ පැවති උද්ඝෝෂණයට සහභාගීවෙමින් පැවසීය.



## විශ්‍රාම වැටුප් කප්පාදුවට එරෙහිව
# ජනාධිපතිට ටෙලිමේල්

විශ්‍රාම වැටුප් කප්පාදුවට එරෙහිව පසුගිය මාර්තු 15 රටපුරා සියළු දිස්ත්‍රික්ක ආවරණය කරමින් ටෙලිමේල් යැවීමේ වැඩ සටහනක් විශ්‍රාමිකයින්ගේ හිමිකම් සුරැකීමේ ජාතික සංවිධානය විසින් සංවිධානය කර තිබිණි. "අහිමි කරන ලද විශ්‍රාම වැටුප කරුණාකර ලබාදෙන්න" යනුවෙන් සටහන් කරන ලද එම ටෙලිමේල් පණිවිඩය ජනාධිපතිවරයා වෙත යැවීමට තටයුතු කර ඇත.




## බෙස්ට් පැසිෆික් සත්‍යග්‍රහය නිමාවෙයි

මාකඳුර බෙස්ට් පැසිෆික් ආයතනයේ සේවක ගැටලු හා සේවක මර්දනයට එරෙහිව සේවකයින් විසින් ආරම්භ කර තිබූ අඛණ්ඩ සත්‍යග්‍රහය නිමා කර ඇත.

බ්‍රැන්ඩික්ස් බෙස්ට් පැසිෆික් ආයතනයේ සේවකයින් කම්කරු කොමසාරිස්වරයා සමග වූ සාකච්ඡාවේ එකඟතා අනුව කම්කරු නීතියට යටත්ව කටයුතු කිරීමට පාලකයින් සහ සේවකයින් එකඟතාවය පලකර ඇත. සත්‍යග්‍රහය ආරම්භ කිරීමට හේතු වූයේ ආයතන පාලනාධිකාරිය සේවකයින්ගේ ඉල්ලීම් තුට්ටුවකට මායිම් නොකරමින් කටයුතු කරමින් සිටි බවත් මෙයට කිසිසේත් ඉඩ තැබීමට තම සංගමය ඉඩ නොතැබූ බවත් දැනට සේවයෙන් ඉවත්කොට ඇති සේවකයින් වහාම බඳවාගත යුතු බවත් එසේ නොවන්නේ නම් මෙම සටන දීපව්‍යාප්ත සටනක් බවට පත්කිරීමට සිදුවන බවත් පවසමින් සත්‍යග්‍රහය ආරම්භ කර තිබූ අතර අවසානයේ කම්කරු කොමසාරිස්වරයාගේ මැදිහත්වීම මත එකඟතාවයන්ට පැමිණීමෙන් සටන නිමා කිරීමට කටයුතු කළ බව අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරී සහෝදරයා පැවසූ අතර ඉදිරියේදී අවශ්‍ය නීතිමය මැදිහත්වීම් සිදුකරන බවද ඔහු අවධාරණය කළේය.

464/20, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයේ පදිංචි කේ.ඩී. ලාල්කාන්ත වන මා විසින් මුද්‍රණය කරවන ලදී.


# රතු ලංකා
සමගිය තුලින් ජයග්‍රහණය

වැඩබිමේ පුවත් ඇති සැටියෙන් දැනගන්න



web: www.unions.lk
FB: unionslanka
YouTube: unions TV

සමාජවාදී කම්කරු සංගමයේ මධ්‍යම පුවත්පත 2021 අප්‍රේල් 26 වන කාණ්ඩය 03 වන පත්‍රය ආධාරය රු: 40/=


## දැවැන්ත විරෝධතාවයකට
# සෞඛ්‍ය සේවකයෝ පෙළගැසෙති

**ආදේශක සේවකයින් වහාම ස්ථිර කිරීම, පුහුණුව නිම කළ උපස්ථායක පත්වීම් වහා ලබා දීම, කොවිඩ් විශේෂ දීමනාවක් වහා ලබාදීම, දින පහේ සතිය ක්‍රියාත්මක කිරීම, එකඟ වූ රු.12,000/= නිල ඇඳුම් දීමනාව වහා ලබාදීම ඇතුලු ඉල්ලීම් 12 ක් මූලික කරගනිමින් සෞඛ්‍ය සේවකයෝ දැවැන්ත සටනකට සූදානම් වන බව සමස්ත ලංකා සෞඛ්‍ය වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති සමන්ත කෝරළේආරච්චි සහෝදරයා රතු ලංකා වෙත පැවසීය.**

පසුගිය කාලය පුරාවට මෙම ඉල්ලීම් සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම සෞඛ්‍ය බලධාරීන් සමග සාකච්ඡා පැවැත්වූ බවත් මෙම ඉල්ලීම් අතිශය සාධාරණ බව ඔවුන් පිළිගත් නමුත් මේ දක්වාම එම ඉල්ලීම් ඉටු කිරීමට බලධාරීන් කටයුතු නොකිරීම නිසා ඉදිරියේදී දිවයින පුරා සියලුම රෝහල්වල දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් දියත් කිරීමට තම සම්මේලනය කටයුතු යොදා ඇතැයිද කෝරළේආච්චි සහෝදරයා වැඩිදුරටත් සඳහන් කළේය. තම සම්මේලනය සෞඛ්‍ය සේවකයින්ගේ සාධාරණ අයිතීන් වෙනුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ සටන් ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වී සිටින බවත් ඉදිරියේදීද සෞඛ්‍ය සේවකයින්ගේ අයිතීන් වෙනුවෙන් තම සම්මේලනය අඛණ්ඩව අරගලවලට නිරත වන බවත් සඳහන් කරන කෝරළේආරච්චි සහෝදරයා පාලකයින් විසින් කපන බොරු වලවල්වල නොවැටී තමන් සමග එකතු වන ලෙස සමස්ත සෞඛ්‍ය සේවකයින්ගෙන් ඉල්ලා සිටින බවද සඳහන් කළේය.




